## හැඳින්වීම

*ශ්‍රී ලංකා ආර්ථිකය 2000 වර්ෂය තුළදී ශක්තිමත්ව වර්ධනය විය. උද්ධමනය මධ්‍යස්ථව පැවතුන අතර රැකියා වියුක්තිය තවදුරටත් අඩු විය. ඛනිජ තෙල් ආනයන මිල ඉහළ යෑම, ජාතික ආරක්ෂක වියදම් වැඩි වීම සහ අයහපත් කාලගුණ තත්ත්වය යන අහිතකර තත්වයන් යටතේ මෙම ජයග්‍රහණය අත්පත් කර ගැනීමට හැකි වීම ඉතා ප්‍රශංසනීය වේ. කෙසේ නමුදු මෙම අහිතකර සාධක හේතුකොටගෙන ගෙවුම් ශේෂයේ හා රාජ්‍ය අංශයෙහි හිඟයන් බෙහෙවින් අයහපත් අතට හැරුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජය හා රාජ්‍ය සමායතනවල දේශීය බැංකු ණය ගැනීම් තියුණු ලෙස වර්ධනය වූ අතර විදේශ වත්කම් අඩු වී රුපියල අවප්‍රමාණය වීමට බලපෑම් ඇති විය. මෙහි අනු ප්‍රතිඵලයක් වශයෙන් පොලී අනුපාතිකද සැලකිය යුතු අන්දමින් ඉහළ නැගුණි. මෙම තත්ත්වයන් පාලනය කරනු සඳහා ප්‍රතිපත්තිමය පියවර කීපයක් හඳුන්වා දෙන ලදී. රාජ්‍ය වියදම් විධිමත් කිරීම, රජයේ ආදයම් වැඩි දියුණු කිරීමේ ක්‍රියා මාර්ග, පාලිත මිල ගණන් ඉහළ නැංවීම, රුපියල නිදහසේ පාවීමට ඉඩ සැලැස්වීම සහ සමපේක්ෂණ කටයුතු වලක්වා ගැනීම සඳහා අවශ්‍ය පරිපාලන ක්‍රියාදමයන් හඳුන්වා දීම මෙම පියවරයන්ට ඇතුළත් වේ. විදේශීය විනිමය වෙළඳපොළ දැන් ස්ථාවරව ඇති අතර අයවැය හිඟයන් අඩු කරනුවස් ඉදිරි පියවර ගනිමින් පවතී. මේවායේ ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතික අඩුවනු ඇතැයි බලාපොරොත්තු වේ. 2001 වර්ෂයේ ගෙවුම් ශේෂයෙහි අතිරික්තයක් සහ විදේශීය සම්පත්වල වැඩිවීමක් ඇතිවේයයි අපේක්ෂා කෙරේ.*

- ▲ 1999 දෙවන භාගයේ සිට ආරම්භ වූ ආර්ථික කටයුතුවල යථා තත්ත්වයට පත්වීම 2000 වසරේද නොකඩවා සිදුවිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1999 දී සියයට 4.3 ක්වූ ආර්ථික වර්ධනය 2000 වසරේදී සියයට 6 ක් දක්වා කැපී පෙනෙන ලෙසින් ඉහළ නැගුණි. ආර්ථිකයේ සියලු අංශයන් මෙම වර්ධනයට දයක වූ අතර නිෂ්පාදන කර්මාන්ත හා සේවා අංශය මේ අතුරෙන් ප්‍රමුඛ විය.
- ▲ 1999 හා සසඳන කල 2000 දී ආයෝජන මට්ටමෙහි හා පෞද්ගලික ඉතුරුම් මට්ටමෙහි වැඩිදියුණු වීමක් දක්නට ලැබුණි.
- ▲ ඉහළ ආර්ථික වර්ධනය සහ ආයෝජන පුළුල් වීම මගින් රැකියා ඉඩ ප්‍රස්ථා ඇති වූ අතර විරැකියාව සියයට 8 දක්වා අඩු විය.
- ▲ ජාත්‍යන්තර මිල ගණන්වල වෙනස්වීම් හේතුකොට ගෙන ඇතැම් පාලිත මිල ගණන් වැඩි කිරීමට සිදු වුවද, වාර්ෂික උද්ධමනය සියයට 6.2 මට්ටමෙහි පවත්වා ගැණුනි.
- ▲ ආනයනය හා අපනයනය 1999 පැවති පහළ මට්ටමෙන් මිදුනු බැවින් ජාත්‍යන්තර වෙළඳාමෙහි ශක්තිමත් වර්ධනයක් දක්නට ලැබුණි.
- ▲ අපනයන ඉහළයාම සහ පෞද්ගලික ප්‍රේෂණ හා මූල්‍ය ගිණුම් තුළින් මෙරටට වූ ලැබීම් ඉහළ ගියද ඛනිජ තෙල් ආනයන සහ ආරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ ගෙන්වීම සඳහා වූ වියදම් ඉහළ යාම නිසා ආනයන පිරිවැය වැඩිවීමෙන් ගෙවුම් ශේෂයෙහි සමස්ත හිඟය වැඩි විය.
- ▲ ගෙවුම් ශේෂයෙහි හිඟය පියවීම පිණිස විදේශීය මුදල් උපයෝජනය කිරීම නිසා විදේශ විනිමය සංචිත පහත වැටුණි.
- ▲ රාජ්‍ය මූල්‍ය අංශයෙහි පිරිහීමක් දක්නට ලැබුණි. ආරක්ෂණ කටයුතු සඳහා වියදම් ඉහළ යාමත්, අපේක්ෂිත ප්‍රමාණයට වඩා ආදයම් අඩු වීමත් නිසා අයවැය හිඟය වැඩි විය. මේ සමඟම පෞද්ගලීකරණ ක්‍රියාවලිය ප්‍රමාදවීම හා විදේශ සම්පත් ලැබීම් පහත වැටීම නිසා රජයට දේශීය මූලයන්ගෙන් අධික වශයෙන් ණය ලබා ගැනීමට සිදුවිය.
- ▲ රජය විශාල වශයෙන් ණය ගැනීමද, විදේශීය විනිමය වෙළඳපොළ ස්ථාවර කරනු පිණිස මහ බැංකුව විසින් ගණු ලැබූ පියවරද හේතුකොටගෙන පොලී අනුපාතය තියුණු ලෙසින් ඉහළ නැගුණි.
- ▲ මුදල් සැපයුමේ වර්ධනය අධික නොවූ බැවින් උද්ධමනයට ඉල්ලුම වැඩිවීමෙන් සිදුවන බලපෑම ප්‍රබල නොවීය.
- ▲ 2001 වර්ෂයේදී ආර්ථිකයෙහි මධ්‍යස්ථ වර්ධන වේගයක් අපේක්ෂා කරනු ලැබේ. උද්ධමනය සීමා කිරීම සඳහා පියවර ගනු ඇත. අයවැය හා විදේශීය ජංගම ගිණුම් හිඟයන් පහත හෙළනු ඇත. ගෙවුම් ශේෂයෙහි සමස්ත අතිරික්තයක් බලාපොරොත්තු වේ. ප්‍රතිපත්ති මාලාවක් මගින් විදේශ සංචිත ගොඩ නංවා ගැනීමට කටයුතු කරනු ලබන අතර මින් සමහර පියවර දැනටමත් ක්‍රියාත්මක කොට තිබේ.